## 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පොත් අනුව මුළු ආදායම සහ මූල්‍ය ප්‍රකාශන අනුව මුළු ආදායම අතර රු.801,944 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස අනෙකුත් දෙපාර්තමේන්තු මඟින් කල ආපසු ගෙවීම් වේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අගයන් භාණ්ඩාගාර පොත් සමඟ නිවැරදිව සැසඳීම. |
| (ආ) | 2020 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් රැස් කළ ලියාපදිංචි කිරීමේ ගාස්තු ආදායම රු.858,103,568ක් ලෙසACA - 1 ආකෘතියේ සඳහන් කළද දෙපාර්තමේන්තුවේ මාසික සාරාංශ ගත ආදායම් වාර්තාව අනුව එම අගය රු.749,731,548ක් විය. | දෙපාර්තමේන්තුව විසින් ආදායම් වාර්තා පිළියෙල කල දිනට ගාස්තු ආදායම රු.749,731,548ක් විය. භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එම අගය රු.858,103,568ක් විය. ආදායම් වාර්තා වීමේ අඩුපාඩු නිසා මෙම වටිනාකම් සැසඳීම කල නොහැක. | ආදායම් වාර්ථා ලබා ගැනීම හා සැසඳීම නිසි පරිදි සිදු කිරීම |
| (ඇ) | 2020 වර්ෂයට අදාළව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 26 ක සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 65 ක මාසික ආදායම් සාරාංශ වාර්තා ලබා දී නොතිබුණු බැවින් රු.1,399,877,263 ක් වූ ලියාපදිංචි කිරීමේ ගාස්තු ආදායම විගණනයේදී සනාථ කරගත නොහැකි විය. | ආදායම් වාර්තා ප්‍රාදේශීය කාර්යාල වලින් නියමිත දිනට නොලැබෙන බැවින් පරිගණක මෘදුකාංගයක් මඟින් ආදායම් වාර්තා කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරිමට සාකච්ඡා කරමින් පවති. | ආදායම් වාර්ථා ලබා ගැනීම හා සැසඳීම නිසි පරිදි සිදු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ නොතාරිස්වරුන්ට මහාධිකරණ සහතික නිකුත් කිරීමේ ආදායම භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන හා මූල්‍ය ප්‍රකාශන අනුව රු.4,813,771 ක් වූ අතර, දෙපාර්තමේන්තුව මගින් රැස් කරන ලද රු.672,000 කින් හා මහාධිකරණ වලින් රැස් කරනු ලැබූ රු.4,141,771 කින් එම අගය සමන්විත වුවද මහාධිකරණ වලින් නිකුත් කරන සහතික පිළිබඳ තොරතුරු වාර්තා හඳුනා ගැනීමට නිසි ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් සකස් කර නොතිබුණු බැවින් එම ආදායම විගණනයේදී සනාථ කරගත නොහැකි විය. | අදාල ආදායම් වාර්තා නිසි පරිදි නොලැබීම මත මේ තත්ත්වය උද්ගත වී ඇත. ඉදිරියේදි නිවැරදි කර ගැනිමට සුදුසු පියවර ගෙන ඇත. | ආදායම් වාර්තා නිසි පරිදි පවත්වාගෙන යාම. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ලියාපදිංචි ආදායම රු.858,103,568 ක් වුවද ඒ තුළ ඇතුළත් හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම්, උධෘත පිටපත් ගාස්තු, ඇටෝර්නි බලපත්‍ර ගාස්තු ඇතුළු අනෙකුත් ලියාපදිංචි කිරීමේ ආදායම් වෙන වෙනම හඳුනා ගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වෙන වෙනම ආදායම් හඳුනා ගැනිමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කරන අතර වාර්තා ලැබෙන පරිදි වරින් වර යාවත්කාලීන කරනු ලැබේ. | ආදායම් වාර්තා නිසි පරිදි පවත්වාගෙන යාම. |

**1.6.2 ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ සඳහන් වෙනත් ලැබීම් වටිනාකම රු.74,296,750 ක් වුවද මූල්‍ය ප්‍රකාශනයේ එය රු.74,721,885 ක් ලෙස සටහන් වී තිබීමෙන් වෙනත් ලැබීම් රු.425,135 කින් අධිගණනය වී තිබුණි. | ආපසු ගෙවීම් අතපසුවීමකින් අඩු වී නැත. | වෙනත් ලැබීම් නිවැරදිව ගිණුම් ගත කිරීම. |

**1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

---

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පරිසණක මුද්‍රිත සටහන් අනුව තත්‍ය ලැබීම් වටිනාකම රු.54,346,605 ක් වුවද දෙපාර්තමේන්තු පොත් අනුව වර්ෂයේ තත්‍ය ලැබීම් රු.54,107,804ක් වූයෙන් දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර සටහන් අතර රු.238,801ක වෙනසක් නිරීක්ෂණය විය. | විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනකුගේ ණය ශේෂ වැරදිමකින් දෙවරක් පියවීම නිසා වූ වරද නිවැරදි කිරීම. | භාණ්ඩාගාර පරිසණක මුද්‍රිත සටහන් හා දෙපාර්තමේන්තු පොත් සසඳා නිවැරදිව ගිණුම් සැකසීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදි දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පරිසණක මුද්‍රිත සටහන් අනුව හරස් සටහන් මඟින් සිදුකල හර කිරීම් වල රු.1,417,401ක වෙනසක් නිරීක්ෂණය විය. | ණය නිරවුල් කිරීම හා පැවරිම හරස් සටහන් මඟින් සිදු කිරීමේදී භාණ්ඩාගාර ලේඛන වල සිදුවූ වරද නිවැරදි කිරීමේදී මෙම වෙනස වාර්තා වී ඇත. | -එම- |

**1.6.4 දේපල පිරියත හා උපකරණ**

---

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 ට දෙපාර්තමේන්තුව සතු ඉඩම් වල වටිනාකම රු.1,558,895,000 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල ඉඩම් වල අගය ඇතුලත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කරගැනිමට නිලධාරීන්ට උපදෙස් ලබා දි ඇත. | වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් වල අවසාන ශේෂය හා භාණ්ඩාගාරයේ මූල්‍ය නොවන වත්කම් සාරාංශය (Bos Summary) අනුව එම ශේෂය අතර රු.270,015,439 ක වෙනසක් නිරීක්ෂණය විය. | වර්ගීකරණයේ සිදු වූ දෝෂයක් බැවින් නිවැරදි කරගැනීමට පියවර ගනිමි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරිම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය නොවන වත්කම් වල ආරම්භක ශේෂය හා 2020 වර්ෂයේ භාණ්ඩාගාරයේ මූල්‍ය නොවන වත්කම් සාරාංශයේ (Bos Summary) ආරම්භක ශේෂය අතර රු.53,598,949 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනත් අමාත්‍යාංශ වල ප්‍රතිපාදන යටතේ මිලදී ගත් වත්කම් වල අගයන් ගැලපීමෙන් පසුවද මෙම වෙනස ඇත. | වෙනසට හේතු සොයා නිවැරදි කිරිම. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී, මිලදී ගැනීම් හා මාරු කිරීම් මගින් රු.95,538,470 ක "වෙනත් යන්ත්‍ර හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්" අත්පත් කරගෙන තිබුණද මූල්‍ය නොවන වත්කම් සාරාංශයේ (Bos Summary) එම අගය රු.7,983,402 ක් ලෙස සටහන් වී තිබුණි. | මූල්‍ය නොවන වත්කම් **web interface** වෙත නියමිත දිනය යාවත්කාලින කිරිමට නොහැකි විය. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරිම. |

### 1.6.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය තුළ ඇතුළත් ආදායම් වටිනාකම එකතුව රු.1,754,184,688 ක් වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු.1,827,802,708 ක් වූ බැවින් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.73,618,020 කින් අවප්‍රමාණය වී තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදලින් කල ගනුදෙනු පමණක් සටහන් කර තිබීම. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් පිළියෙල කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව අත්තිකාරම් අයකර ගැනීම් වටිනාකම රු.3,216,396 ක් වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු. 54,346,605 ක් වූ බැවින් අත්තිකාරම් අයකර ගැනීම් රු. 51,130,209 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | හරස් සටහන් වල වටිනාකම ගැලපූ විට ශේෂ පිරික්සුමේ අගය සමඟ ගැලපේ. | -එම- |
| (ඇ) | මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය තුළ තැන්පතු ලැබීම් ලෙස රු.3,901,600 ක් ගිණුම් ගත කර තිබුණු නමුත් ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ එම අගය රු.7,992,203ක් විය. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම රු. 1,605,000,000 ක් වූ අතර සත්‍ය ආදායම රු. 1,404,691,034 ක් හෙවත් ආදායමෙන් සියයට 88 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායම හා සත්‍ය ආදායම අතර වෙනස රු. 200,308,966ක් හෙවත් සියයට 12 ක් විය. | කොවිඩ් 19 වසංගත තත්ත්වය මත ආදායම් රැස් කිරීම අඩු වී ඇත. | ආදායම නිවැරදිව ඇස්තමේන්තු කිරීම හා සංශෝධනය කිරීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේ හිඟ ආදායම රු.24,896,693 ක් හා වර්ෂය තුළ හිඟ හිටි රු.3,137,710 ක් වශයෙන් එකතුව රු.28,034,403 ක් වූ මුළු හිඟ ආදායමෙන් වර්ෂය තුළ අයකරගැනීම් රු.1,311,326 ක් හෙවත් සියයට 4.7 ක් පමණක් වීමෙන් වර්ෂය අවසානයට හිඟ ආදායම රු.26,723,078 ක් විය. | හිඟ ආදායම් වාර්තා වැරදි ලෙස පිළියෙල කර රෙජිස්ට්‍රාර් කාර්යාල විසින් එවා ඇත. එය නිවැරදි කර නිවැරදි අගය ලැබුණු පසු ගිණුමට ඇතුලත් කරනු ලැබේ. | හිග ආදායම් නිවැරදිව ගිණුම් ගත කිරීම. |

## 2.2 වියදම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 66/69 යටතේ අදාළ බලධාරියා විසින් අනුමැතිය ලබා දී ප්‍රතිපාදන මාරු කරන තෙක් කිසිදු වැය විෂයයකට වැඩිපුර වියදම් දැරීමට නොහැකි වුවද දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ වැය විෂයයන් 03 ක එකතුව රු.1,962,196 ක වියදම් ප්‍රතිපාදන ඉතිරි වී ඇති වැය විෂයන් මගින් දරා තිබුණු අතර වර්ෂය අවසානයේ එම වැය විෂයයන්ට ප්‍රතිපාදන මාරු කරගත් පසු අධිභාර හා වැරදි නිවැරදි කිරීම් ලෙස සටහන් කර නිවැරදි වැය විෂයයන්ට එම වියදම් සටහන් කර තිබුණි. | අත්‍යාවශ්‍ය වියදම් දැරීමට ප්‍රතිපාදන නොතිබීම නිසා අදාල වියදම් දරා ඇත. | යොමුගත රෙගුලාසි වලට අනුකූල වීම. |
| (ආ) 2020 වර්ෂයේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූලධන වැය විෂයයන් 2ක් වෙනුවෙන් වෙන් කල මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.7,037,000 වූ අතර 2020 දෙසැම්බර් මස ශුද්ධ වියදම රු 4,987,379 ක් විය. මේ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 71 ක්ම 2020 දෙසැම්බර් මාසයේදී වියදම් කර තිබුණි. | රට තුල පැවති අයහපත් තත්ත්වය නිසා නිසි පරිදි ප්‍රසම්පාදන කටයුතු කර ගැනීමට නොහැකි වීම. | ප්‍රතිපාදනයන් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීම. |
| (ඇ) 2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවට වෙන්කල ප්‍රතිපාදන වලින් පුනරාවර්තන වැය විෂයයන් 05ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 04ක ශුද්ධ ප්‍රතිපාදනය රු.43,035,000ක් වූ අතර සත්‍ය වියදම රු.26,014,829ක් විය. ඒ අනුව ඉතිරිවීම් සියයට 26 සිට සියයට 89 දක්වා වූ පරාසයක විය. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ප්‍රමාණවත් පරිදි අක්මුදල් ලබා ගැනීමට නොහැකි වීම. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2020 වර්ෂයේදී වියදම් කල හැකි මුළු ප්‍රතිපාදනයෙන් සියයට 59ක් පමණක් වියදම් කර තිබුණි. | පළමුව අනුමත කල රු.මිලියන 37 න් රු.මිලියන12ක් වියදම් කර ඇතත් දෙවනුව අනුමත කල රු.මිලියන 14 න් රු.මිලියන13.9ක්ද අවසානයට අනුමත කල රු.මිලියන 10ක්ද සම්පූර්ණයෙන් වියදම් කර ඇත. | -එම- |

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට බැරකම් වටිනාකම රු.50,596,314 ක් වුවද 2021 මාර්තු 31 දින දක්වා නිරවුල් කර තිබුණු බැරකම්වල අගය රු.30,394,918ක් විය. | දෙපාර්තමේන්තුව විසින් ගෙවනු ලබන රෙජිස්ට්‍රාර් දීමනා වවුචර්පත් මෙම බැරකම් ලේඛනයේ සඳහන් නොවේ. | බැරකම් ගිණුම්ගත කිරීම හා පියවීම විධිමත් කිරීම. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(2) වගන්තිය හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10.2 ඡේදය | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම. | වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. | අදාළ චක්‍රලේඛ විධිවිධාන වලට අනුගත වීම. |
| (ආ) | 2006 අංක 12 සහ 2008 අංක 10 දරණ මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත | නොතාරිස්වරුන්ගෙන් වාර්ෂික මහාධිකරණ සහතික නිකුත් කිරීමේ ගාස්තු අයකිරීමේදී , නොතාරිස්වරයෙකු වශයෙන් | නිලධාරීන් සේවයට වාර්තා නොකිරීම නිසා කාර්යය ප්‍රමාද වී ඇත. ඉදිරියේදී | ආදායම් හා වියදම් නිවැරදිව සහ කාලීනව |

| | | | | |
|---|---|---|---|---|
| | | කටයුතු කිරීම සඳහා ප්‍රථම වරට බලපත්‍රයන් නිකුත් කිරීම වෙනුවෙන් අයකරන මුද්දර ගාස්තු අදාල කාර්තුව අවසාන වී එළඹෙන ඊලඟ මාසයේ 15 දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට බැර කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.එසේම මෙම මුද්දර ගාස්තු වටිනාකම හඳුනා ගැනීමට අවශ්‍ය තොරතුරුද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | ගිණුම්ගත කිරිම. විගණනයට අවශ්‍ය තොරතුරු නොපමාව ලබාදිම. |
| (ඇ) | මුදල් රෙගුලාසි 94 (1) හා 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා වියදමකට හෝ බැඳීමකට නොබැඳිය යුතු වුවද දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කරගැනීම් වල අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා රු.38,881 ක බැඳීම් වලට එලඹී තිබුණි. තවද පිළිවෙලින් රු.1,035,772ක හා රු.1,564,595ක අතිකාල හා නිවාඩු වැටුප් (1002) සහ “වෙනත් දීමනා” (1003) බැඳීම් ලෙස හඳුනාගෙන තිබුණි. | අක්මුදල් ප්‍රමාණවත් නොවීම නිසා සිදුවී ඇත. නැවත මෙවැනි සිදුවීම් වලක්වාලීමට පියවර ගෙන ඇත. ප්‍රතිපාදන ඉතිරි වී තිබුණ ද භාණ්ඩාගාරයෙන් අක්මුදල් නොලැබීම. | යොමුගත රෙගුලාසි වලට අනුගත වීම. |
| (ඈ) | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 ඡේදය | 2020 වර්ෂයේදී මිලදී ගත් එකතුව රු.29,893,331 ක හා මාරු කිරීම් මගින් ලැබුණු රු.65,645,139 ක් වටිනා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වෙනත් දෙපාර්තමේන්තු වල ප්‍රතිපාදන වලින් ලබාගත් වත්කම් ගිණුම් වල ගලපා ඇතත් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත යවා නැත. නිවැරදි කිරීම් කර අදාල වාර්තා යවනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කිරිම. |
| (ඉ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි මාර්ගෝපදේශ අංක 6 හි 07 ඡේදය | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු හෝ භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු හෝ වටිනාකම හා මුදල් පොත අනුව එම වටිනාකම සැසඳීම සඳහා අක්මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කල යුතු වුවද ඒ වෙනුවට දෙපාර්තමේන්තුව | අක්මුදල් ගිණුම ගැලපීම් ගිණුම පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොතිබුණු බැවින් නිවැරදිව පිළියෙල කර ඉදිරිපත් කරමි. | යොමුගත චක්‍රලේඛ වලට අනුගත වීම. |

| | | |
|---|---|---|
| | විසින් අග්‍රිම ගිණුම හා අග්‍රිම ශේෂ ගිණුම නමින් ගිණුම් දෙකක් සකස් කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2019 සම්පිණ්ඩන වාර්තාවේද පෙන්වා දුන් නමුදු මේ වසරේද අදාල ගැලපීම් ගිණුම සකස් කර නොතිබුණි. | |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් 'බී' ගිණුම අනුව සමාලෝචිත වර්ෂය අවසානයට මියයාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම, සේවය අතහැර යාම හා සේවයෙන් පහ කිරීම යන කාරණා මත නිලධාරින් 51 දෙනෙකුගෙන් වසර 1 සිට වසර 29 දක්වා අයවීම් හිඟහිටි මුළු ශේෂය රු.3,239,780ක් විය | ඉතිරි ණය ශේෂ අයකර ගැනීමට හා කපා හැරීමට අවශ්‍යා පියවර ගනිමින් පවති. | ආයතන සංග්‍රහයේ විධි විධාන අනුව ණය අයකිරීමට අවශ්‍යා ක්‍රියාමාර්ග ගැනීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාහන ඇණිය තුල වාහන 41ක් ඇති අතර මින් වාහන 23ක් දෙපාර්තමේන්තුව විසින් මිලදී ගෙන තිබුණි. වාහන 17ක් නීතිපති දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේදී පවරා දී තිබුණු නමුත් මින් වාහන 6ක් පමණක් 2020 වර්ෂයේදී ධාවනය සඳහා යොදාගෙන තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | වාහන පරිපාලනය විධිමත් කිරීම |
| (ආ) 2018 වර්ෂයේ සිට භාවිතයට ගෙන නොමැති පිරිවැය රු. මිලියන 2.3 ක් වූ අංක 254 - 1061 දරන වෑන් රථය අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි මට්ටමක පැවතියද මේ දක්වා අළුත්වැඩියා කටයුතු සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කි.මී.25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් 2019 වර්ෂයෙන් පසුව වාහන වල ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | -එම- |
| (ඈ) | 2006 වර්ෂයේදී මිලදී ගත් අංක PB 4896 හා අංක PB 4888 දරන වාහන දෙක 2018 වර්ෂයේ සිට භාවිතයට ගෙන නොමැති අතර එම වාහන ධාවනය කල නොහැකි තත්ත්වයේ පවතින බව දෙපාර්තමේන්තු වාර්තා අනුව සඳහන් වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම වාහන අපහරණය සඳහා පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | -එම- |
| (ඉ) | 2006 වර්ෂයේදී මිලදී ගත් පිරිවැය රු. මිලියන 3.2 ක් බැගින් වූ අංක PB 4897 හා PB 4899 දරන මයික්‍රෝ කැබ් රථ 2ක් අළුත්වැඩියා කටයුතු සඳහා අමතර කොටස් නොමැති බව සඳහන් කරමින් 2019 වර්ෂයේ සිට භාවිතයට නොගන්නා අතර එම වාහන සම්බන්ධයෙන් කිසිදු විධිමත් පියවරක් ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | -එම- |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| (අ) 2011 අප්‍රේල් 04 දිනැති අංක DMS/C/5/30/02 දරන කළමණාකරන සේවා දෙපාර්තමේන්තු ලිපිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලය තුල ඇතුලත් ජ්‍යෙෂ්ඨ කළමණාකරණනයේ ප්‍රධාන තනතුරු 6ක පුරප්පාඩු 26ක් දීර්ඝ කාලයක සිට පැවතිණි. රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරද 2017 වර්ෂයේ සිට පුරප්පාඩු වී පැවති අතර වරින්වර වැඩ බැලීමේ හා වැඩ ආවරණය කිරිමේ පදනමින් පත්විම් ලබාදී තිබුණු බැවින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වෙත මෙය අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය විය. 2021 පෙබරවාරි මාසයේදී රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු ස්ථිරව පත්කර තබුණි. | පිළිතුරු ඉදිරිපත්කර නොමැත. | මානව සම්පත් කළමණාකරනය විධිමත් කිරිම. |
| (ආ) දෙපාර්තමේන්තුවේ තෘතියික, ද්විතීයික හා ප්‍රාථමික මට්ටම්වල තනතුරු 241ක්ද සමාලෝචිත වර්ෂය අවසානයට පුරප්පාඩු වී තිබුණි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයට සෘජුවම සම්බන්ධ වන ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්ගේ පුරප්පාඩු 30ක්ද මෙහි ඇතුලත් වී තිබුණි. | -එම- | -එම- |